# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO — 217 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 07/02/2024 පැය 2145

## මාධ්‍ය නිවේදනය

**පාසල් අවට මත්ද්‍රව්‍ය සංසරණය වීම් වැලැක්වීම සඳහා වැටලීම් සිදු කිරීම හා "පවුර" සංසද කමිටු ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.**

දිවයින පුරා පාසල් 10221 අතරින් පාසල් අවට මත්ද්‍රව්‍ය සංසරණයක් තිබෙන බවට හඳුනාගෙන තිබූ පාසල් 4983ක් අවට පසුගිය මාස කිහිපය තුල ශ්‍රිලංකා පොලිසිය හා පොලිස් විශේෂ කාර්ය බලකාය එක්ව වැටලීම් සිදුකර ඇත.

එහිදී හෙරොයින් ග්‍රෑම් 85ක්, අයිස් ග්‍රෑම් 48ක්, මත්පෙති 1561ක්, ගංජා කිලෝ 01 ග්‍රෑම් 230ක්, මාවා කිලෝ 03 ග්‍රෑම් 650ක්, මදන මෝදක කිලෝ 02 ග්‍රෑම් 345ක්, නීති විරෝදී සිගරට් 1285ක් හා දුම්කුඩු කිලෝ 01 ග්‍රෑම් 585ක් සමඟ පාසල් අවට මත්ද්‍රව්‍ය අලෙවි කල සැකකරුවන් 517 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

ඒ අනුව පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි එලෙස මත්ද්‍රව්‍ය සංසරණයක් තිබෙන බවට හඳුනාගත් සෑම පාසලක් ආශ්‍රිතවම අදාල පාසල් ගුරුවරුන්, ශිෂ්‍ය නායකයින් හා පාසල් අවට ශිෂ්‍ය ප්‍රජාව සහභාගී කරවා ගනිමින් "පවුර" සංසද කමිටු 5133ක් පිහිටුවා ඇති අතර එම කමිටු සාමාජිකයින් විසින් ලබා දුන් වාර්තා අනුව පාසල් 4876ක් ආශ්‍රිතව මත්ද්‍රව්‍ය සුලබතාවය පිලිබඳ පැවති අවදානම යම් දුරකට පහව ගොස් ඇති බවට අනාවරණය වී ඇත.

එසේම පාසල් 107ක් ආශ්‍රිතව මත්ද්‍රව්‍ය අවදානම පවතින බවට "පවුර" සංසද කමිටු මගින් වාර්තා වී ඇති අතර එම පාසල් අවට තව දුරටත් මෙමෙහෙයුම් සිදු කරන ලෙසටත්, ළමුන් නොමඟ යැවීමට පොළඹවන ස්ථාන ඇති බවට හඳුනාගෙන ඇති පාසල් 434ක් ආශ්‍රිතව ඉදිරි කාලය තුල මෙහෙයුම් සිදු කරන ලෙසටත් අදාල පාසල් පිහිටි පොලිස් කොට්ඨාස භාර නිලධාරීන් වෙත පොලිස්පතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

පාසල් ආශ්‍රිතව දරුවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් පිහිටවන ලද මෙම "පවුර" සංසද කමිටු තව දුරටත් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම පොලිස්පතිතුමාගේ අපේක්ෂාවයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**